**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියාව කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහනේ දෙවන අදියර 2021 මාර්තු 1 වන දින සිට අරඹයි**

ඉන්දියාවේ කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහනේ දෙවන අදියර සුදුසු වයස් කණ්ඩායම් සඳහා 2021 මාර්තු 01 වන දින සිට ඇරඹිණ. සෞඛ්‍ය සේවකයන් සහ ඉදිරි පෙළ සේවකයින්ගෙන් අනතුරුව මෙම අදියරේදී අවධානය යොමු කරන්නේ වයස අවුරුදු 60න් ඉහළ අයවලුන් සහ විවිධ රෝගාබාධ සහිත අවුරුදු 45-60 අතර අයවලුන් වෙතය. පළමු අදියරේදී  මිලියන 15ක පමණක් ජනතාවක් ආවරණය කළ අතර දෙවන අදියරේදී එන්නත්කරණ මිලියන 100ක් පමණ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

2. එන්නත්කරණ වැඩසටහනේ දෙවන අදියර ආරම්භ කළ මාර්තු පළමු වන දින නව දිල්ලියේදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ඉන්දියාව විසින් සොයාගත් කොවැක්සින් එන්නත ලබා ගත්තේය. ඉන්දියාවේ සීරම් ඉන්සිටිටියුට් විසින් නිෂ්පාදනය කරනු ලබන ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනිකා හි කොවිෂීල්ඩ් එන්නතට අමතරව භාරත් බයෝටෙක් විසින් නිෂ්පාදනය කරනු ලබන කොවැක්සින් එන්නත භාවිතය සඳහා ඉන්දියාව අවසර ලබා දී තිබේ. එන්නත ලබා ගැනීමෙන් අනතුරුව අග්‍රාමාත්‍යතුමා කොවිඩ්-19 වසංගතයට එරෙහි ගෝලීය සටන ශක්තිමත් කිරීමට කඩිනමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් වෛද්‍යවරුන්ට සහ විද්‍යාඥයන්ට සිය ප්‍රශංසාව පළ කළේය.

3. ඉන්දියාව වසංගතයට එරෙහි මනුෂ්‍ය වර්ගයාගේ සටනෙහි පෙරමුණ ගෙන සිටී. එන්නත් මාත්‍රා මිලියන ගණනක් ලොව පුරා රටවලට ලබා දීම හරහා ඉන්දියාව සිය එන්නත් නිෂ්පාදන ශක්‍යතාවයන් ගෝලීය සුබසිද්ධිය උදෙසා භාවිතා කර තිබේ. ශ්‍රී ලංකාව ඇතුළු අසල්වැසියන් සහ සහකාර රාජ්‍යයන් වෙත ඉන්දියාව විසින් එන්නත් පරිත්‍යාග කරන ලදී. ඉන්දියාව මේ දක්වා ශ්‍රී ලංකාවට කොවිෂීල්ඩ් එන්නත් මාත්‍රා මිලියනයක් ලබා දී ඇති අතර එයින් 50%ක් ප්‍රදාන වශයෙන් ලබා දී ඇත. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් තවත් කොවිෂීල්ඩ් එන්නත් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

4. මේ අතර ඉන්දියානු මහ කොමසාරිස්තුමා නාරාහේන්පිට හමුදා රෝහලේදී කොවිෂීල්ඩ් එන්නත ලබා ගත් අතර එය කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහනෙහි දෙවන අදියර ඉන්දියාවේ ආරම්භ කිරීමට සමගාමීව සිදු වීම විශේෂත්වයකි. මෙය ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන එන්නත්කරණ වැඩසටහනෙහි කොටසකි.මේ යටතේ ශ්‍රී ලංකාවේ තිබෙන විදේශ තානාපති කාර්යාල අකාරාදී පිළිවෙළට ආවරණය කරනු ලැබේ.

* * *

**කොළඹ**
**2021** මාර්තු **03**